## දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව
## අම්පාර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 14 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 16 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ඔක්තෝබර් 22 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනේන අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කැරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

ගිණුම්කරණ අඩුපාඩු.

මහවැලි සංවර්ධන අධිකාරිය විසින් සභාව වෙත පවරා දී ඇති පොදු ක්‍රීඩාංගන හා සුසාන භූමි වල වටිනාකම ගණනය කර, මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,185,177 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 485,914 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය.

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිග ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිග ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිගය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (අ) | වරිපනම් හා බදු | 4,571 | 3,389 | 1,182 |
| (ආ) | බදු කුලී | - | - | - |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 977 | 1,163 | (186) |
| (ඈ) | වෙනත් ආදායම් | 9,644 | 8,821 | 823 |

### 2.2.2 උසාවි දඩ

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ මුදල රු. 455,083 ක් විය.

## 2.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්.

සභාව සතුව පැවති රු. 225,000 ක වටිනාකමකින් යුතු රෝද හතරේ ට්‍රැක්ටරයක් වර්ෂ 05 කට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණ අතර බජාජ් වර්ගයේ ත්‍රිරෝද රථය අලුත්වැඩියා කර භාවිතා කළහැකිව තිබුණද 2011 ජුනි මාසයේ සිට අලුත්වැඩියා කිරීමකින් තොරව ප්‍රාදේශීය සභා භූමිය තුල ගාල්කර තිබුණි.

## 2.4 කොන්ත්‍රාත් පරිපාලනය

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 ට අනුව ප්‍රජා පාදක සංවිධාන සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමේදී එහි සඳහන් කොන්දේසිවලට අනුව කිසියම් කාලයක් තුළ සමිතියක් විසින් ඉටු කරනු ලබන මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාව තුනකට නොවැඩි විය යුතු අතර දැනටමත් පිරිනමා ඇති කොන්ත්‍රාත්තුවල ඉතිරි කොටසේ මුළු වටිනාකම සහ යෝජිත කොන්ත්‍රාත්තුවේ වටිනාකම් එකතුව රුපියල් මිලියන 2 නොඉක්මවිය යුතු වුවත්, එම විධි විධාන වලට පටහැනිව එක් ගොවි සංවිධානයක් සඳහා රු. 125,000 සිට රු. 2,375,000 දක්වා වූ කොන්ත්‍රාත් 04 සිට 09 දක්වා වූ ප්‍රමාණයක් ගොවි සංවිධාන 06 ක් වෙත පිරිනමා තිබුණි.

2.5 අභ්‍යන්තර විගණනය.
-----------------------
ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සමාලෝචිත වර්ෂය තුළ සිදු කර නොතිබුණි.

3 පද්ධති හා පාලන
------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කලමනාකරණය
(ඈ) ණයගැති හා ණයහිමි පාලනය්